61517



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | |
|---|---|
| ගිණුම්කරණය | I |
| கணக்கீடு | I |
| Accounting | I |

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ✳ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ✳ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- ✳ සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
- ✳ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- ✳ **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය : ................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ **මූලික අරමුණ** කුමක්ද?
(1) නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව ගනුදෙනු සටහන් කිරීම සහ වාර්තා කිරීම.
(2) ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
(3) වාර්ෂික බාහිර විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන මගින් තොරතුරු සැපයීම.
(4) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම.
(5) කළමණාකරුවන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු සැපයීම. (......)

● **අංක 2, 3, 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නුවන් විසින් 2020.01.01 දින ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් ආරම්භ කරන ලදී. ඔහුගේ සොහොයුරු සුජිත් මෙම ව්‍යාපාරයේ එකම සේවකයා වේ. පහත ගනුදෙනු 2020 ජනවාරි මාසය තුළ සිදු විය.

| අංකය | ගනුදෙනුව | වටිනාකම (රු.'000) |
|---|---|---|
| 1 | ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා නුවන් මුදල් යෙදවීම | 300 |
| 2 | ලිපිද්‍රව්‍ය අත්පිට මුදලට මිල දී ගැනීම | 200 |
| 3 | ලිපිද්‍රව්‍ය ණයට මිල දී ගැනීම | 550 |
| 4 | දෝෂ සහිත වූ බැවින් ණයට මිල දී ගත් ලිපිද්‍රව්‍ය වලින් කොටසක් ආපසු යැවීම | 50 |
| 5 | ලිපිද්‍රව්‍ය ණයට විකිණීම. මෙය තුළ රු. 64 000 ක එකතු කල අගය මත බදු (VAT) අඩංගු ය | 864 |
| 6 | සුජිත්ට වැටුප් ගෙවීම | 40 |

මාසය තුළ විකුණූ ලිපිද්‍රව්‍යවල පිරිවැය රු. 500 000 ක් විය. 2020.01.31 දිනට ව්‍යාපාරය විසින් ගෙවිය යුතු විදුලි වියදම රු. 30 000 ක් විය. ගැනුම් සහ අනෙකුත් වියදම් මත VAT නොමැති බව උපකල්පනය කරන්න.

**2.** ගනුදෙනු අංක 2, 3, 4 සහ 5 සටහන් කිරීමට යොදාගනු ලබන මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙළින් :
(1) ඉන්වොයිසිය, භාණ්ඩ ලැබීම් තුණ්ඩුව, හරපත, ඉන්වොයිසිය
(2) ඉන්වොයිසිය, භාණ්ඩ ලැබීම් තුණ්ඩුව, බැරපත, ඉන්වොයිසිය
(3) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, හරපත, ඉන්වොයිසිය
(4) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, බැරපත, ඉන්වොයිසිය
(5) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, බැරපත, ජර්නල් වවුචරය (......)

[දෙවැනි පිටුව බලන්න.

3. ගනුදෙනු අංක 1, 2, 3 සහ 4 හි **ශුද්ධ බලපෑම** නිරූපණය කරනු ලබන ගිණුම්කරණ සමීකරණය කුමක් ද?

| | වත්කම් (රු.'000) | = | වගකීම් (රු.'000) | + | හිමිකම (රු.'000) |
|---|---|---|---|---|---|
| (1) | + 800 | | + 550 | | + 250 |
| (2) | + 800 | | + 500 | | + 300 |
| (3) | + 850 | | + 550 | | + 300 |
| (4) | + 1 000 | | + 700 | | + 300 |
| (5) | + 1 000 | | + 750 | | + 250 |

(……)

4. මෙම ව්‍යාපාරය ණයගැති පාලන ගිණුමක් පවත්වාගෙන යන්නේ නම්, ගනුදෙනු අංක 5 සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

| | | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|---|
| (1) | ණයගැති පාලන ගිණුම | 800 | |
| | විකුණුම් ගිණුම | | 800 |
| (2) | ණයගැති පාලන ගිණුම | 864 | |
| | විකුණුම් ගිණුම | | 864 |
| (3) | ණයගැති පාලන ගිණුම | 800 | |
| | VAT වියදම් ගිණුම | 64 | |
| | විකුණුම් ගිණුම | | 864 |
| (4) | ණයගැති පාලන ගිණුම | 864 | |
| | විකුණුම් ගිණුම | | 800 |
| | VAT පාලන ගිණුම | | 64 |
| (5) | ණයගැති පාලන ගිණුම | 800 | |
| | VAT වියදම් ගිණුම | 64 | |
| | විකුණුම් ගිණුම | | 800 |
| | VAT පාලන ගිණුම | | 64 |

(……)

5. 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා මෙම ව්‍යාපාරයෙහි දළ ලාභය සහ ශුද්ධ ලාභය කොපමණ ද?

| | දළ ලාභය (රු.' 000) | ශුද්ධ ලාභය (රු.' 000) |
|---|---|---|
| (1) | 300 | 230 |
| (2) | 300 | 260 |
| (3) | 300 | 270 |
| (4) | 364 | 294 |
| (5) | 364 | 324 |

(……)

- **අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක් එහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපාරයේ 2020 පෙබරවාරි මාසයේ අවසාන මුදල් ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර වෙනසක් නොවී ය. කෙසේ වුව ද, 2020.03.31 දිනට මුදල් ගිණුමේ ශේෂය වූ රු. 500 000 එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. මාර්තු මාසයේ බැංකු ප්‍රකාශනය 2020.04.03 දින ලද අතර, එය පරීක්ෂා කිරීමේදී පහත දෑ හෙළිදරව් විය.

A - 2020.03.29 දින තැන්පත් කරන ලද රු. 100 000 ක චෙක්පතක් උපලබ්ධි වී නොමැත.

B - ස්ථාවර නියෝග මත ගෙවන ලද මාර්තු මාසයේ ණය වාරිකය රු. 30 000 කි.
(මෙය තුළ අඩංගු පොලී වියදම රු. 12 000 කි.)

C - 2020.03.30 දින බැංකුවේ තැන්පත් කරන ලද රු. 80 000 ක චෙක්පතක් 2020.03.31 දින අගරු වී ඇත.

D - රු. 120 000 ක ආයෝජන ආදායමක් බැංකු ගිණුමට සෘජුව බැරකර ඇත.

සෘජු ප්‍රේෂණ, ස්ථාවර නියෝග ගෙවීම් සහ අගරු වූ චෙක්පත් පොත්වල සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව පමණි.

ඉහත 'A' සහ 'C' මගින් නිරූපනය කරනු ලබන්නේ ණයගැතියන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ ගෙවිය යුතු ශේෂ පියවීම සඳහා ලබාදුන් චෙක්පත් ය.

[තුන්වැනි පිටුව බලන්න.

6. 2020.03.31 දිනට මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය:

| | **මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය (රු.' 000)** | **බැංකු ප්‍රකාශනයේ ශේෂය (රු.' 000)** |
|---|---|---|
| (1) | 410 | 510 |
| (2) | 510 | 410 |
| (3) | 510 | 510 |
| (4) | 590 | 410 |
| (5) | 590 | 510 |

(......)

7. A, B, C සහ D අයිතම වලින් 2020 මාර්තු මාසය සඳහා ලාභයට සහ 2020.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂයට ඇති **ශුද්ධ බලපෑම** කොපමණ ද?

| | **ලාභයෙහි වැඩිවීම (රු.' 000)** | **ණයගැති පාලන ගිණුමේ ශේෂය වැඩිවීම/(අඩුවීම) (රු.' 000)** |
|---|---|---|
| (1) | 90 | (100) |
| (2) | 90 | (20) |
| (3) | 108 | (20) |
| (4) | 108 | 80 |
| (5) | 120 | 80 |

(......)

8. ගිණුම්කරණ සංකල්ප භාවිතය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ණයගැතියන් සහ ණයහිමියන් හඳුනා ගැනීම සඳහා උපචිත සංකල්පය පදනම සපයනු ලබයි.

B - පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග මැනීම සඳහා ගැළපුම් සංකල්පය පදනම සපයනු ලබයි.

C - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වත්කම් සහ වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම සඳහා අඛණ්ඩ පැවැත්මේ සංකල්පය පදනම සපයනු ලබයි.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම ය. (......)

9. පහත කුමන ගිණුම්කරණ පිළිවෙත/පිළිවෙත්, යථාරූපී සංකල්පයේ භාවිතය නිරූපණය කරනු ලබයි ද?

A - ආයතනයක් විසින් ගෙවිය යුතු ආදායම් බදු වගකීමක් ලෙස හඳුනා ගැනීම.

B - 'වත්කමක භාවිත අයිතිය' කල්බදු ගැනුම්කරුගේ මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස හඳුනා ගැනීම.

C - ආයතනයක සම්මුතික බැඳීමක් එහි වගකීමක් ලෙස හඳුනා ගැනීම.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම ය. (......)

10. 2020.04.01 දින නාමල් වෙළෙන්දෝ විසින් එහි මෙහෙයුම් ආරම්භ කරන ලදී. 2020 අප්‍රේල් මාසය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| **මූලික පොත්වල එකතුව :** | **රු.' 000** | **වෙනත් තොරතුරු :** | **රු.' 000** |
|---|---|---|---|
| විකුණුම් ජර්නලය | 220 | විකුණුම් පිරිවැය | 110 |
| ගැනුම් ජර්නලය | 200 | මෙහෙයුම් වියදම් **(වට්ටම් හැර)** | 60 |
| ආපසු එවුම් ජර්නලය | 20 | ලද වෙළෙඳ වට්ටම් | 20 |
| ආපසු යැවුම් ජර්නලය | 10 | දුන් වෙළෙඳ වට්ටම් | 8 |
| | | ලද මුදල් වට්ටම් | 5 |
| | | දුන් මුදල් වට්ටම් | 10 |

2020 අප්‍රේල් මාසය සඳහා හඳුනාගත් මුළු ආදායම සහ මුළු වියදම:

| | **මුළු ආදායම (රු.'000)** | **මුළු වියදම (රු.'000)** |
|---|---|---|
| (1) | 200 | 170 |
| (2) | 205 | 170 |
| (3) | 205 | 180 |
| (4) | 220 | 180 |
| (5) | 225 | 188 |

(......)

[හතරවැනි පිටුව බලන්න.

**11.** මුහුණු ආවරණ නිෂ්පාදනය කිරීම සඳහා 2020.04.01 දින මධු විසින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ මුහුණු ආවරණ 12 000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි. මෙම වර්ෂය සඳහා අයවැයගත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු. 360 000 ක් වේ.

2020 අප්‍රේල් මාසය තුළදී පහත සත්‍ය පිරිවැය දරන ලදී.

| | |
|---|---|
| රෙදිවල පිරිවැය (ඒකකයක් සඳහා) | රු. 60 |
| සෘජු සැකසුම් පිරිවැය (ඒකකයක් සඳහා) | රු. 20 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 30 000 |
| නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය | රු. 20 000 |

අප්‍රේල් මාසය තුළදී ඒකක 1 000 ක් නිෂ්පාදනය කරන ලද අතර, ඒකක 800 ක් ඒකකයක් රු. 150 බැගින් විකුණන ලදී. 2020 අප්‍රේල් මාසය සඳහා ලාභය සහ 2020.04.30 දිනට නිමි තොගයේ පිරිවැය:

| | **මාසය සඳහා ලාභය (රු.)** | **තොගයේ පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 6 000 | 16 000 |
| (2) | 6 000 | 22 000 |
| (3) | 12 000 | 16 000 |
| (4) | 12 000 | 22 000 |
| (5) | 16 000 | 26 000 |

(……)

**12.** 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයක් රු.150 000 ක ලාභයක් වාර්තා කරන ලදී. කෙසේ වුව ද පසුව කරන ලද පරීක්ෂාවකදී ගිණුම් පොත්වල පහත වැරදි අනාවරණය විය.

- 2020 මාර්තු මාසය සඳහා මුළු ණයට විකුණුම් රු. 650 000 ක් විකුණුම් ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ රු. 560 000 ක් ලෙස සටහන් කර තිබුණි.
- වෙළෙඳ ණයගැතියෙකුට ලබාදුන් රු. 20 000 ක මුදල් වට්ටමක් ණයගැති පාලන ගිණුමේ පමණක් පිටපත් කර තිබුණි.
- බැංකු තැන්පතුවකින් ලද රු. 25 000 ක පොලී ආදායමක් පොලී වියදම් ගිණුමට බැර කර තිබුණි. කෙසේ වුව ද මෙම වටිනාකම මුදල් ගිණුමෙහි නිවැරදිව සටහන් කර තිබුණි.
- වර්ෂය සඳහා මෝටර් රථ මත ක්ෂය රු. 30 000 ක් මෙතෙක් වෙන් කර නොතිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසුව 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** ලාභය කොපමණ ද?

(1) රු. 165 000 (2) රු. 190 000 (3) රු. 210 000
(4) රු. 215 000 (5) රු. 235 000 (……)

**13.** ක්‍රීඩා සමාජයක 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ තොරතුරු පහත දැක්වේ.

| | **රු.** |
|---|---|
| • වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම | 300 000 |
| • වර්ෂය තුළ කපාහරින ලද පසුගිය වර්ෂයේ හිඟහිටි සාමාජික මුදල් | 50 000 |
| • ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා ලද පරිත්‍යාග (මින් රු. 100 000 ක් ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා 2020.03.31 දින භාවිත කර ඇත.) | 500 000 |
| • ක්‍රීඩා පිටිය කුලියට දීම වෙනුවෙන් වර්ෂය තුළ ලද ඉතිරි මුදල (මේ සඳහා 2019.03.30 දින රු. 150 000 ක අත්තිකාරම් මුදලක් ලැබී තිබුණි.) | 100 000 |

පරිත්‍යාගවලින් භාවිත කරන ලද වටිනාකම පමණක් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

ඉහත අයිතම නිසා ක්‍රීඩා සමාජයේ 2020.03.31 දිනට සමුච්චිත අරමුදලෙහි ශේෂය **වැඩිවීම**:

(1) රු. 350 000 (2) රු. 450 000 (3) රු. 500 000
(4) රු. 600 000 (5) රු. 900 000 (……)

**14.** හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - හවුල් ව්‍යාපාර විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය නොකළ යුතු ය.

B - හවුල්කරුවන් විසින් ව්‍යාපාරයේ කළමනාකරණයට හවුල්කරුවන් ලෙස දායක වූ විට ඔවුන්ට ගෙවන වේතන හවුල් ව්‍යාපාරයේ වියදම් ලෙස සලකනු ලැබේ.

C - ප්‍රාග්ධනයට දායක වූ අනුපාතයට ලාභාලාභ බෙදාගැනීමට හවුල්කරුවන්ට ලිඛිත ගිවිසුමකින් එකඟ විය හැක.

D - හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස් වන විට, එහි කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලැබේ.

(1) B හා C පමණි. (2) C හා D පමණි. (3) A, B හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි. (......)

● **අංක 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

මීනා සහ රාධා විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයේ කොන්දේසි පහත පරිදි වේ.

- මීනා සහ රාධා අතර ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙළින් 3 : 2 වේ.
- මීනා සහ රාධා පිළිවෙළින් රු. 450 000 ක සහ රු. 350 000 ක වාර්ෂික වේතනයකට හිමිකම් කියයි.

**අනෙකුත් තොරතුරු:**

ජංගම ගිණුම්වල බැර ශේෂ:

| | **2020.03.31 දිනට (රු.'000)** | **2019.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| මීනා | 600 | 250 |
| රාධා | 480 | 200 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වැටුප් ගෙවීම් සහ භාණ්ඩ ගැනිලි:

| | **මීනා (රු.'000)** | **රාධා (රු.'000)** |
|---|---|---|
| වැටුප් | 300 | 200 |
| භාණ්ඩ ගැනිලි | 100 | 120 |

හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය සඳහා රාධාට ගෙවිය යුතු රු. 50 000 ක වාර්ෂික පොලිය ඇයගේ ජංගම ගිණුමට බැර කර ඇත.

**15.** 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය:

(1) රු. 500 000 (2) රු. 850 000 (3) රු. 1 250 000
(4) රු. 1 300 000 (5) රු. 1 350 000 (......)

**16.** 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාධාට විසර්ජනය කළ මුළු ලාභය:

(1) රු. 200 000 (2) රු. 250 000 (3) රු. 280 000
(4) රු. 550 000 (5) රු. 600 000 (......)

**17.** පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව **නිවැරදි** වේ ද?

A - කාලච්ඡේදය සඳහා ක්ෂය සෑම විට ම ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතු ය.

B - දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලික හඳුනාගැනීමේදී පිරිවැයට මැනිය යුතු ය.

C - වත්කමක් ප්‍රවර්තන වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ඇති වූ අතිරික්තය එම වත්කම සම්බන්ධව පෙර ප්‍රත්‍යාගණන ඌනතාවයක් නොමැති විට හඳුනාගත යුත්තේ, වෙනත් විස්තීරණ ආදායමෙහි ය.

(1) A පමණි. (2) C පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම ය. (......)

**18.** 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අජිත් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2020.06.15 දින අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී. 2020.03.31 දින සිට 2020.06.15 දින දක්වා කාලය තුළ පහත සිදුවීම් සමාගමේ සිදු විය.

A - 2020.03.31 දිනට රු. මිලියන 5 ක ධාරණ වටිනාකමක් සහිත යන්ත්‍රයක් 2020.04.15 දින ඇති වූ ගින්නකින් සම්පූර්ණයෙන්ම විනාශ විය.

B - 2020.03.31 දිනට රු. 800 000 ක් ගෙවිය යුතු වෙළෙඳ ණයගැතියෙකු බුන්වත් වූ බව 2020.05.10 දින උසාවිය විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

C - රු. මිලියන 10 ක මහජන කොටස් නිකුතුවක් 2020.06.10 දින සිදුකරන ලදී.

LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව ඉහත කුමන සිදුවීම/සිදුවීම් මෙම සමාගමේ **ගැලපීම් නොකළ යුතු** සිදුවීමක්/සිදුවීම් ලෙස සැලකිය යුතු ද?

(1) A පමණි. (2) C පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම ය. (......)



Past Papers Wiki

**19.** LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව පහත කුමන අයිතමය/අයිතම නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය කටයුතු තුළින් ඇතිවන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කළ යුතු ද?

A - වෙනත් සමාගම්වල මිල දී ගත් සාමාන්‍ය කොටස් සඳහා ලද ලාභාංශ මුදල්

B - වෙනත් ආයතනවල ණයකර මිල දී ගැනීම සඳහා ගෙවූ මුදල්

C - කල්බදු වගකීමක් පියවීම සඳහා ගෙවූ මුදල්

(1) B පමණි. (2) C පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම ය. (……)

**20.** සීමිත සුමුදු පොදු සමාගම විසින් 2020.01.01 දින රු. 2 500 000 කට නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කිරීමට යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. සමාගම විසින් මේ සඳහා පහත පිරිවැය ද දරන ලදී.

| | රු.' 000 |
|---|---|
| වැඩබිම සකස් කිරීමේ පිරිවැය | 200 |
| සවිකිරීමේ පිරිවැය | 350 |
| ගිනි රක්ෂණය සඳහා වාර්ෂික වාරිකය | 275 |
| මූලික පරීක්ෂණ ධාවනයේ පිරිවැය | 250 |

මූලික පරීක්ෂණ ධාවනයේදී නිෂ්පාදනය කළ අයිතම විකිණීමෙන් ලද ශුද්ධ ආදායම රු. 50 000 කි.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනාගැනීමේදී මෙම යන්ත්‍රයේ පිරිවැය කොපමණ ද?

(1) රු. 3 050 000 (2) රු. 3 250 000 (3) රු. 3 300 000
(4) රු. 3 525 000 (5) රු. 3 575 000 (……)

**21.** 2017.04.01 දින සීමිත සුරංග පොදු සමාගම විසින් රු. 8 000 000 කට යන්ත්‍රයක් මිල දී ගන්නා ලද අතර, එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 8 ක් සහ රු. 1 600 000 ක් විය. 2019.04.01 දින වත්කමේ ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය නැවත ඇස්තමේන්තු කරන ලදී. නව ඇස්තමේන්තුවට අනුව ඉතිරි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 4 ක් සහ රු. 1 000 000 ක් විය.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය කොපමණ ද?

(1) රු. 900 000 (2) රු. 1 166 777 (3) රු. 1 350 000
(4) රු. 1 600 000 (5) රු. 1 750 000 (……)

**22.** සීමිත ගමගේ පොදු සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. 2019.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 525 000 ක් විය. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 'ගෙවූ වගකීම් සහතික වියදම්' සහ 'හඳුනාගත් වගකීම් සහතික වියදම්' පිළිවෙළින් රු. 375 000 ක් සහ රු. 650 000 ක් විය.

LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත යුතු වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය කොපමණ ද?

(1) රු. 150 000 (2) රු. 275 000 (3) රු. 650 000
(4) රු. 800 000 (5) රු. 1 175 000 (……)

**23.** සීමිත දමිත පොදු සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම පිළිවෙළින් රු. 1 500 000 ක් සහ රු. 800 000 ක් විය. වෙනත් විස්තීරණ ආදායම ලෙස හඳුනාගෙන ඇත්තේ ප්‍රවර්තන වර්ෂය තුළදී ඉඩම් හා ගොඩනැගිලි දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ඇති වූ රු. 800 000 ක අතිරික්තයයි. 2016.03.31 දින ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු. 350 000 ක ඌනතාවක් ඇති වී තිබුණි.

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** ලාභය සහ මුළු විස්තීරණ ආදායම:

| | **වර්ෂය සඳහා ලාභය (රු.'000)** | **මුළු විස්තීරණ ආදායම (රු.'000)** |
|---|---|---|
| (1) | 1 150 | 1 950 |
| (2) | 1 500 | 1 950 |
| (3) | 1 500 | 2 300 |
| (4) | 1 850 | 1 950 |
| (5) | 1 850 | 2 300 |

(……)

- **අංක 24 සහ 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත කවින්ගා පොදු සමාගම පහත තොරතුරු සපයා ඇත.

| | **රු.' 000** |
|---|---|
| විකුණුම් | 7 000 |
| විකුණුම් පිරිවැය | 4 200 |
| 2019.04.01 දිනට නිමි භාණ්ඩ තොගය | 800 |
| 2020.03.31 දිනට නිමි භාණ්ඩ තොගය | 600 |
| මෙහෙයුම් වියදම් | 1 200 |
| පොලී වියදම් | 320 |
| බදු වියදම | 400 |

2020.03.31 දිනට නිකුත් කර තිබූ සාමාන්‍ය කොටස් ගණන 400 000 ක් වූ අතර, මෙදිනට ව්‍යාපාරයේ හිමිකම රු. 4 400 000 ක් විය.

**24.** සමාගමේ තොග පිරිවැටුම් අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය:

| | **තොග පිරිවැටුම් අනුපාතය (වාර)** | **පොලී ආවරණ අනුපාතය (වාර)** |
|---|---|---|
| (1) | 6 | 4 |
| (2) | 6 | 5 |
| (3) | 6 | 5.6 |
| (4) | 7 | 4 |
| (5) | 7 | 5 |

(……)

**25.** සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය සහ කොටසක ඉපැයුම:

| | **හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (%)** | **කොටසක ඉපැයුම (රු.)** |
|---|---|---|
| (1) | 5 | 2.20 |
| (2) | 5 | 3.20 |
| (3) | 20 | 2.20 |
| (4) | 20 | 3.20 |
| (5) | 20 | 4.00 |

(……)

**26.** පහත තොරතුරු සමාගමක් විසින් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වේ.

| | **ඒකකයක පිරිවැය (රු.)** |
|---|---|
| මුළු පිරිවැය | 250 |
| සෘජු පිරිවැය | 60 |
| නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය | 100 |

සියලු සෘජු පිරිවැය විචල්‍ය පිරිවැය වේ. තවද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයෙන් 50% ක් සහ නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැයෙන් 25% ක් විචල්‍ය පිරිවැය වේ.

මෙම භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය සහ ඒකකයක විචල්‍ය පිරිවැය:

| | **ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.)** | **ඒකකයක මුළු විචල්‍ය පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 105 | 120 |
| (2) | 105 | 130 |
| (3) | 150 | 105 |
| (4) | 150 | 120 |
| (5) | 150 | 130 |

(……)

- **අංක 27 සහ 28 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් සතුව එකලස් සහ නිමැවුම් ලෙස නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් ඇත. පහත තොරතුරු එම පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ වේ.

| | **එකලස්** | **නිමැවුම්** |
|---|---|---|
| යන්ත්‍ර පැය මත අන්තර්ග්‍රහණ අනුපාතය (රු.) | 7 | 9 |
| යන්ත්‍ර පැය ගණන (අයවැයගත) | 5 000 | 4 000 |
| කිලෝවොට් පැය ගණන (අයවැයගත) | 300 | 700 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 160 000 | 120 000 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 6 000 | 4 000 |

ඉහත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීමෙන් පසුව පහත වැරදි අනාවරණය විය.

- රු. 14 000 ක් වූ අයවැයගත යන්ත්‍ර ක්ෂය මෙම ගණනය කිරීමේ දී ඇතුළත් කර නොමැති බව
- රු. 10 000 ක් වූ අයවැයගත විදුලි ගාස්තුව කිලෝවොට් පැය වෙනුවට භූමි ප්‍රමාණය මත විභජනය කර ඇති බව

**27.** ඉහත වැරදි නිවැරදි කළ පසු නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානයට බෙදාහල මුළු පොදු කාර්ය පිරිවැය කොපමණ ද?
(1) රු. 36 000 (2) රු. 40 000 (3) රු. 42 000
(4) රු. 45 000 (5) රු. 49 000 (……)

**28.** ඉහත වැරදි නිවැරදි කළ පසු එකලස් පිරිවැය මධ්‍යස්ථානය සඳහා සංශෝධිත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය කොපමණ ද?
(1) රු. 8.00 (2) රු. 9.00 (3) රු. 9.20 (4) රු. 10.00 (5) රු. 11.25 (……)

**29.** පිරිවැය-පරිමා-ලාභ විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?
(පහත එක් එක් අවස්ථාවට අදාළ අනෙකුත් සියලු ම සාධක ස්ථාවරව පැවැති බව උපකල්පනය කරන්න.)

A - ඒකක දායකය අඩු වීම, සමච්ඡේදන ලක්ෂ්‍යයෙහි ඒකක ගණන අඩු වීමට හේතු වේ.
B - දායක විකුණුම් අනුපාතයේ වැඩි වීම, සමච්ඡේදන ලක්ෂ්‍යයේ වටිනාකම අඩු වීමට හේතු වේ.
C - සමච්ඡේදන ලක්ෂ්‍යයෙන් ඔබ්බට ඒකක දායකය ඒකක ලාභයට සමාන වේ.
D - ඒකක විකුණුම් මිල වැඩි වීම, සමච්ඡේදන ලක්ෂ්‍යය අඩු වීමට හේතු වේ.

(1) B හා C පමණි. (2) C හා D පමණි.
(3) A, B හා C පමණි. (4) B, C හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම ය. (……)

**30.** නිෂ්පාදන ව්‍යාපාරයක් ඇරඹීම සඳහා සීමිත නිහාල් පොදු සමාගම නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායි ජීව කාලය වසර 5 කි. මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය සහ ප්‍රතිලාභ පහත දී ඇත.

| | **රු.' 000** |
|---|---|
| නව යන්ත්‍රයේ ගැනුම් මිල | 1 100 |
| යන්ත්‍රය ස්ථාපනය කිරීමේ පිරිවැය | 200 |
| 5 වන වසර අවසානයේ දී යන්ත්‍රයේ සුන්බුන් අගය | 100 |
| වාර්ෂික මුදල් ගලාඒම් | 335 |

ව්‍යාපෘතිය ආරම්භයේදී අවශ්‍ය කාරක ප්‍රාග්ධනය රු. 150 000 ක් වන අතර එය ව්‍යාපෘතියේ අවසාන වසරේදී අයකර ගත හැකි ය.

ව්‍යාපෘතියේ මූලික මුදල් ගලායාම සහ ව්‍යාපෘතියේ අවසාන වර්ෂයේ මුදල් ගලාඒම පිළිවෙළින්:

| | **මූලික මුදල් ගලායාම (රු.' 000)** | **අවසාන වර්ෂයේ දී මුදල් ගලාඒම (රු.' 000)** |
|---|---|---|
| (1) | 1 100 | 250 |
| (2) | 1 100 | 585 |
| (3) | 1 300 | 585 |
| (4) | 1 450 | 250 |
| (5) | 1 450 | 585 |

(……)

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

**31.** ව්‍යාපාරයක් විසින් පිළියෙල කරනු ලබන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|
| A - මෙම ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කරනු ලබයි. | ................. |
| B - මෙම ප්‍රකාශන මූලික වශයෙන් ව්‍යාපාරයට සම්පත් සපයන පාර්ශ්වවල භාවිතය සඳහා පිළියෙල කරනු ලබයි. | ................. |
| C - මෙම ප්‍රකාශන ව්‍යාපාරයේ අතීත කාලච්ඡේදයකට අදාළ තොරතුරු සපයනු ලබයි. | ................. |
| D - මෙම ප්‍රකාශන ව්‍යාපාරයක ඓතිහාසික පිරිවැය පදනම මත පමණක් මිනුම් කරන ලද තොරතුරු සපයනු ලබයි. | ................. |

**32.** පහත තොරතුරු ව්‍යාපාරයක ගිණුම් වාර්තාවලින් උපුටා ගන්නා ලදී.

| | **2020.03.31 දිනට (රු.' 000)** | **2019.03.31 දිනට (රු.' 000)** |
|---|---|---|
| වත්කම් | 1 700 | 1 200 |
| වගකීම් | 900 | 700 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් රු. 120 000 ක ව්‍යාපාරයේ ණය වාරිකයක් ගෙවන ලදී. තම දරුවන්ගේ පාසල් ගාස්තු ගෙවීම සඳහා අයිතිකරු විසින් සෑම වර්ෂයකදී ම ව්‍යාපාරයෙන් රු. 90 000 ක් ලබා ගනී. ඔහු වෙනත් කිසිදු මුදලක් ව්‍යාපාරයෙන් ලබා නොගනී.

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ:

(අ) ලාභයː රු. ..........................

(ආ) රඳවාගත් ඉපැයුම්ː රු. ..........................

**33.** මෝටර් රථ අලෙවි කරන සමාගමක පහත එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා යොදාගනු ලබන මූලික සටහන් පොත දක්වන්න.

| ගනුදෙනුව | මූලික පොත |
|---|---|
| A - මෝටර් රථ ණයට මිල දී ගැනීම | ..................................... |
| B - මෝටර් රථ ප්‍රවාහනය කිරීම සඳහා ට්‍රක් රථයක් ණයට මිල දී ගැනීම | ..................................... |
| C - මෝටර් රථ ණයට විකිණීම | ..................................... |
| D - විකුණුම් කොමිස් ගෙවීම | ..................................... |

**34.** පහත ගනුදෙනු මගින් ව්‍යාපාරයක ණයහිමි පාලන ගිණුමේ ශේෂයට වන බලපෑම ගණනය කර, ශේෂය **වැඩිවේ නම් (+)** ද, **අඩුවේ නම් (−)** ද වටිනාකම ඉදිරියේ දක්වන්න.

| ගනුදෙනුව | බලපෑම (රු.'000) |
|---|---|
| A - 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ලැයිස්තුගත මිල රු. 100 000 ක් වූ භාණ්ඩ ණයට මිල දී ගැනීම. | ................... |
| B - 5% ක මුදල් වට්ටමකට යටත්ව ණයහිමියෙකුට ගෙවිය යුතු රු. 50 000 ක ශේෂයක් පියවීම සඳහා මුදල් ගෙවීම. | ................... |

**35.** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඓතිහාසික පිරිවැය සංකල්පය අනුගමනය **නොකරන** අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**36.** ව්‍යාපාරයක 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත ගනුදෙනු දෙක ගැළපුම් කිරීමට අදාළ ජර්නල් සටහන් ලියන්න. (සංලක්ෂ්‍ය අවශ්‍ය නොවේ.)

A - රු. 180 000 ක ඇණවුමක් සඳහා 2020.03.31 දින භාණ්ඩ විකුණන ලදී. මෙම ඇණවුම 2020 පෙබරවාරි මාසය තුළදී රු. 60 000 ක අත්තිකාරම් මුදලක් සමග ලැබී තිබුණි. ඉතිරි මුදල ලැබීමට නියමිත ය.

B - 2020.03.01 දිනෙන් ආරම්භ වී තුන් මසක කාලයක් තුළ අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 90 000 ක් මුදල් ගෙවා ගිවිසුමකට එළඹෙන ලදී. 2020.03.01 දින සිට මෙම ගිවිසුම නියමිත පරිදි ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

| ගනුදෙනුව | විස්තරය | හර (රු.' 000) | බැර (රු.' 000) |
|---|---|---|---|
| A | | | |
| B | | | |

**37.** ව්‍යාපාරයක් විසින් පොදු ලෙජරයේ පවත්වාගනු ලබන පහත ගිණුම් සඳහා සුදුසු වර්ගීකරණය සඳහන් කරන්න.

| ගිණුම | වර්ගීකරණය |
|---|---|
| A - බොල් ණය | ..................... |
| B - ගැනිලි | ..................... |
| C - පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | ..................... |
| D - කාර්යාල උපකරණ මත සමුච්චිත ක්ෂය | ..................... |

**38.** රොෂාන් සහ හෂාන් ලිඛිත ගිවිසුමක් නොමැතිව 'RH ඇසෝසියේට්ස්' නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. රොෂාන් සහ හෂාන් පිළිවෙළින් රු. 5 000 000 ක් සහ රු. 3 000 000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කර ඇත. තවද රොෂාන් රු. 2 000 000 ක ණය මුදලක් ද ව්‍යාපාරයට ලබා දී ඇත.
මෙම හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| | සත්‍ය/අසත්‍ය |
|---|---|
| A - රොෂාන් සහ හෂාන් ප්‍රාග්ධනය මත 5% ක පොලියකට හිමිකම් ලබයි. | ............ |
| B - රොෂාන් විසින් ලබාදුන් ණය මුදල සඳහා වාර්ෂිකව 5% ක පොලියක් ගෙවිය යුතු ය. | ............ |
| C - රොෂාන් සහ හෂාන් හවුල්කරුවන් ලෙස වේතන ලැබීම සඳහා හිමිකම් නොලබයි. | ............ |
| D - රොෂාන් සහ හෂාන් ලාභාලාභ ඔවුන්ගේ ප්‍රාග්ධන අනුපාතයට බෙදාගත යුතු ය. | ............ |

**39.** හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් පහත එක් එක් වර්ගයේ ලාභ විසර්ජනයන්ට හිමිකමක් ලැබීමට හේතුව සඳහන් කරන්න.

| විසර්ජන වර්ගය | හේතුව |
|---|---|
| A - ප්‍රාග්ධන පොලී | ............................................... |
| B - හවුල් වේතන | ............................................... |
| C - ලාභ කොටස | ............................................... |

**40.** LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|
| A - ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල වර්තමාන කාලයේ සිට බලපැවැත්වෙන පරිදි ගැළපිය යුතු ය. | .................. |
| B - ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් සෑම විට ම අතීතානුයෝගීව භාවිත කරනු ලබයි. | .................. |
| C - වත්කමක ක්ෂය ක්‍රමය වෙනස් කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීමකි. | .................. |
| D - වත්කමක ඵලදායි ජීව කාලය වෙනස්වීම ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමකි. | .................. |

**41.** 2018 වර්ෂයේ දී හඳුන්වා දුන් 'මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට' අනුව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

(අ) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන භාවිත කරන මූලික පාර්ශ්ව වන්නේ ................................ , ................................ සහ ................................ ය.

(ආ) ................................ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් විසින් පාලනය කරනු ලබන ................................ වත්කමක් ලෙස නිර්වචනය කරයි.

[එකොළොස්වැනි පිටුව බලන්න.

**42.** යන්ත්‍රයක භාවිත අයිතිය වසර 4 කට ලබා ගැනීම සඳහා සීමිත සචින් පොදු සමාගම 2019.04.01 දින කල්බදු ගිවිසුමකට එළඹෙන ලදි. මෙදිනට කල්බදු වගකීමේ ආරම්භක මිනුම්කරණ වටිනාකම රු. 1 713 000 ක් විය. කල්බදු ගිවිසුමට අනුව වාර්ෂික කල්බදු වාරිකය රු. 600 000 ක් වන අතර පළමු වාරිකය 2020.03.31 දින ගෙවන ලදී. 2020.03.31 සහ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කල්බදු පොලිය පිළිවෙළින් රු. 257 000 ක් සහ රු. 205 500 ක් වේ.

SLFRS 16 (කල්බදු) ප්‍රමිතයට අනුව, 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලබන කල්බදු වගකීම:

(අ) ජංගම වගකීම: රු. ……………………… (ආ) ජංගම නොවන වගකීම: රු. ………………………

**43.** සීමිත රොෂාන් පොදු සමාගමේ ගිණුම් වාර්තාවලින් 2019.04.01 දිනට පහත ශේෂ උපුටා ගන්නා ලදී.

| | රු.' 000 |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 1 300 |
| රඳවාගත් ඉපැයුම් | 1 600 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම විසින් රු. 800 000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලද අතර, රු. 400 000 ක වටිනාකමට හිමිකම් නිකුතුවක් ද සිදුකරන ලදී. සියලු ම හිමිකම් සඳහා දැනට සිටින කොටස්කරුවන් විසින් දායක විය. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 700 000 ක් වූ අතර, වර්ෂය තුළදී සමාගම විසින් රු. 300 000 ක අතුරු ලාභාංශයක් ගෙවන ලදී. සමාගම විසින් පවත්වාගනු ලබන එකම සංචිතය රඳවාගත් ඉපැයුම් වේ.

2020.03.31 දිනට පහත දෑ සඳහන් කරන්න:

(අ) ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් : රු. ………………………

(ආ) රඳවාගත් ඉපැයුම් : රු. ………………………

**44.** SLFRS 15 (ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් අයභාරය) ප්‍රමිතයට අනුව පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - ගනුදෙනුකරුවෙකු සමඟ ඇතිවන ගිවිසුමක 'කාර්ය සාධන බැඳීම්' කිහිපයක් ඇතුලත් විය හැක. | ……………… |
| B - ව්‍යාපාර ආයතනයක අයභාරය සහ අනෙකුත් සියලු ආදායම් මෙම ප්‍රමිතයට අනුකූලව පමණක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු ය. | ……………… |
| C - ආයතනයක් විසින් ගිවිසුමක් මත අයභාරය හඳුනාගත යුත්තේ එම ගිවිසුමේ එක් එක් කාර්ය සාධන බැඳීම් සපුරන ලද විට පමණි. | ……………… |
| D - ආයතනයක් විසින් ගනුදෙනුකරුවකු වෙත පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා හුවමාරුව වෙනුවෙන් හිමිකම් ලැබීමට අපේක්ෂිත ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ගනුදෙනුවක මිල වේ. | ……………… |

**45.** 2020.03.31 දිනට සමාගමක ක්ෂණික වත්කම් අනුපාතය 1.1 : 1 ක් විය. සමාගමේ ජංගම වත්කම් තුළ ඇතුළත් අනෙකුත් වත්කම්වලට අතිරේකව රු. 250 000 ක තොග සහ රු. 50 000 ක ඉදිරියට ගෙවූ වියදම් ඇතුළත් විය. මෙදිනට ජංගම වගකීම් රු. 500 000 ක් විය.

2020.03.31 දිනට පහත දෑ ගණනය කරන්න:

(අ) ජංගම වත්කම් : රු. ………………………

(ආ) ජංගම අනුපාතය : ………………………………

**46.** ආයතනයක් විසින් පිළියෙල කරනු ලබන කළමනාකරණ ගිණුම්කරණ වාර්තා සම්බන්ධයෙන් පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - මෙම වාර්තා ආයතනයක සියලුම ඇල්මැති පාර්ශ්වයන්ගේ භාවිතය සඳහා ලබාගත හැක. | ……………… |
| B - මෙම වාර්තා කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන වර්තමාන සහ අනාගත තොරතුරු සපයනු ලබයි. | ……………… |
| C - මෙම වාර්තා කළමනාකරුවන්ගේ ඉල්ලීම මත වාර්ෂිකව පිළියෙල කරනු ලබයි. | ……………… |
| D - මෙම වාර්තා ආයතනයෙහි අවශ්‍යතා මත පිළියෙල කරනු ලබයි. | ……………… |

[දොළොස්වැනි පිටුව බලන්න.

**47.** නිෂ්පාදන ව්‍යාපාරයක පහත එක් එක් ක්‍රියාකාරකම සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය සඳහන් කරන්න.

| ක්‍රියාකාරකම | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| A - ගබඩාවෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා කර්මාන්ත ශාලාව විසින් ඉල්ලුම් කිරීම | ..................... |
| B - සැපයුම්කරුවෙකුගෙන් ගබඩාවට අමුද්‍රව්‍ය ලැබීම | ..................... |
| C - කර්මාන්ත ශාලා සේවකයෙකු යම් කාර්යයක් සඳහා ගතකළ කාලය ගණනය කිරීම | ..................... |
| D - කර්මාන්ත ශාලාවේ භාවිත කරන ලද විදුලිය | ..................... |

**48.** විශේෂිත වර්ගයක අමුද්‍රව්‍යයක් භාවිත කරමින් සමාගමක් භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා මෙම අමුද්‍රව්‍යයෙන් කිලෝග්‍රෑම් 10 ක් අවශ්‍ය වේ. මෙම භාණ්ඩයේ මාසික නිෂ්පාදනය ඒකක 50 සිට 75 දක්වා විචලනය වේ. මෙම අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 5 000 ක් වන අතර එහි පොරොත්තු කාලය මාස 2 සිට 4 දක්වා විචලනය වේ.

මෙම අමුද්‍රව්‍ය සඳහා පහත දෑ දක්වන්න.

| තොග මට්ටම | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|
| A - යළි ඇණවුම් මට්ටම | ........................................ |
| B - උපරිම තොග මට්ටම | ........................................ |

**49.** මහල් නිවාසවල වාසය කරන පුද්ගලයන් සඳහා පරිසරය සුරැකීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සුබසාධන සමිතියක් විසින් සංවිධානය කරමින් සිටී. මෙම වැඩසටහනට සහභාගී වන සෑම පුද්ගලයෙකු වෙනුවෙන් රු. 2 000 බැගින් සුබසාධන සමිතිය වෙත ගෙවීමට ජනමාධ්‍ය ආයතනයක් එකඟ වී ඇත. සෑම සහභාගිවන්නෙකු වෙනුවෙන් රු. 1 500 ක පිරිවැයක් දැරීමට සුබසාධන සමිතියට සිදු වේ. අනෙකුත් ඇස්තමේන්තුගත වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| සම්මන්ත්‍රණ ශාලාව සඳහා කුලිය | 45 000 |
| සම්පත් දායකයන්ගේ ආහාර වියදම් | 9 000 |
| ප්‍රචාරණ වියදම් | 6 000 |

පහත දෑ ගණනය කරන්න.

(අ) එක් සහභාගිවන්නකු මත දායකය : රු. ................................

(ආ) වැඩසටහනෙහි ස්ථාවර පිරිවැය : රු. ................................

(ඉ) මුළු පිරිවැය ආවරණය කර ගැනීම සඳහා සහභාගි විය යුතු සංඛ්‍යාව : ....................................

**50.** සීමිත ඇල්ෆා පොදු සමාගම තම ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීම සඳහා නව යන්ත්‍රයක් අත්පත් කර ගැනීමට සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ පිරිවැය රු. 1 700 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 200 000 ක් වේ. සමාගමේ කළමනාකරණ ගණකාධිකාරිවරයා විසින් ව්‍යාපෘතිය ඇගයීමට භාජනය කර ඇති අතර එහි පිළිගෙවුම් කාලය වසර 2 කුත් මාස 6 ක් ලෙස ගණනය කර ඇත. මෙම ව්‍යාපෘතියේ ශුද්ධ මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු පහත පරිදි වේ.

| වසර | ශුද්ධ මුදල් ප්‍රවාහ (රු.) |
|---|---|
| 1 | 600 000 |
| 2 | 750 000 |
| 3 | ? |
| 4 | 450 000 |
| 5 | 425 000 |

**තුන්වන වසර** සඳහා පහත දෑ දක්වන්න:

(අ) ශුද්ධ මුදල් ප්‍රවාහය: රු. ..........................  (ආ) ලාභය: රු. ..........................

* * *

61517



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස්:
* **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

1. සීමිත විනුග පොදු සමාගමේ 2020.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 49 500 | |
| භාවිත අයිතිය සහිත වත්කම | 12 600 | |
| විකුණුම් | | 79 500 |
| විකුණුම් පිරිවැය | 51 300 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 5 400 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 15 500 |
| 2020.03.31 දිනට තොගය | 6 488 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 250 | |
| වන්දි සඳහා ප්‍රතිපාදන | | 800 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 25 000 |
| 2019.04.01 දිනට ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය | | 3 500 |
| 2019.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 5 650 |
| ගෙවිය යුතු පරිපාලන වියදම් | | 300 |
| පරිපාලන වියදම් | 6 462 | |
| බෙදාහැරීමේ පිරිවැය | 5 600 | |
| මූල්‍ය පිරිවැය | 1 900 | |
| වෙනත් වියදම් | 1 500 | |
| කල්බදු වගකීම | | 12 600 |
| ගෙවූ ආදායම් බදු | 1 250 | |
| 2019.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 400 |
| | **143 250** | **143 250** |

අතිරේක තොරතුරු:

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ද සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමය භාවිත කරමින් තොගවල පිරිවැය මිනුම් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වුව ද 2020.03.31 දිනට තොගයේ පිරිවැය වැරදීමකින් හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට මිනුම් කර, එම වටිනාකම ගිණුම්ගත කර ඇත. 2020.03.31 දිනට පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමය මත මිනුම් කරන ලද තොගයේ පිරිවැය රු. 6 750 000 කි.

(ii) වර්ෂය සඳහා පරිපාලන වියදම් පහත අයිතමවලින් සමන්විත විය.

| අයිතමය | රු.'000 |
|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 1 250 |
| සේවක වැටුප් | 2 150 |
| ක්ෂය වියදම් | 2 225 |
| විගණන ගාස්තු | 275 |
| වෙනත් පරිපාලන වියදම් | 562 |
| එකතුව | 6 462 |

(iii) සමාගමේ ප්‍රචාරණ ගාස්තු රු. 350 000 ක් අධ්‍යක්ෂවරයකු විසින් ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුමෙන් ගෙවා ඇත. මෙම මුදල සමාගම විසින් ප්‍රතිපූරණය කර ඇති අතර, එය වැරදීමකින් අධ්‍යක්ෂවරුන්ගේ වේතන තුළ ගිණුම් ගතකර ඇත.

(iv) සමාගම විසින් භාණ්ඩ විකිණීමට සහ විකිණීමෙන් පසු පළමු මාස 6 තුළ නඩත්තු සේවා සැපයීම සඳහා 2020.03.01 දින ගනුදෙනුකරුවෙකු සමග ගිවිසුමකට එළඹෙන ලදී. ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාව රු. 1 500 000 ක් වූ අතර, ඉන් රු. 1 000 000 ක් භාණ්ඩ විකුණුම් සඳහා වන අතර ඉතිරිය නඩත්තු සේවා සැපයීම සඳහා වේ. සමාගම විසින් ගිවිසුම මත එකඟ වූ සියලු භාණ්ඩ 2020.03.31 දින විකුණන ලද අතර ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාවම මුදලින් ලැබී ඇත. මෙම මුළු වටිනාකම විකුණුම් තුළ ගිණුම් ගතකර ඇත.

(v) පහත සඳහන් තොරතුරු දේපළ, පිරියත සහ උපකරණ හා බැඳේ. (සියලු වටිනාකම් රු.'000 වලින් දී ඇත).

| විස්තරය | 2019.04.01 දිනට පිරිවැය/අගය | ප්‍රවර්තන වර්ෂය තුළ මිල දී ගැනීම් | ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය | 2020.03.31 දිනට සමුච්චිත ක්ෂය | 2020.03.31 දිනට ධාරණ වටිනාකම |
|---|---|---|---|---|---|
| ඉඩම් | 22 500 | — | — | — | 22 500 |
| ගොඩනැගිලි | 9 500 | 5 000 | 725 | 4 500 | 10 000 |
| මෝටර් රථ | 9 500 | 6 000 | 1 550 | 3 500 | 12 000 |
| කාර්යාල උපකරණ | 7 500 | — | 1 500 | 2 500 | 5 000 |
| එකතුව | 49 000 | 11 000 | 3 775 | 10 500 | 49 500 |

ව්‍යාපාරයේ ඉඩම් ප්‍රථම වරට 2016.03.31 දින ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම ප්‍රත්‍යාගණනයෙන් ඇති වූ අතිරික්තය ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය තුළින් නිරූපණය වේ. මෙම ඉඩම් 2020.03.31 දින දෙවන වරට රු. 18 000 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. කෙසේ වුව ද එය මෙතෙක් ගිණුම්ගත කර නොමැත.

වර්ෂය තුළ ගොඩනැගිලි සහ මෝටර් රථ පිළිවෙළින් 2019.10.01 දින සහ 2020.01.01 දින මිල දී ගෙන ඇත. කෙසේ වුව ද මිල දී ගත් දින නොසලකා වැරදි සහගත ලෙස වත්කම්වල වර්ෂ අවසාන පිරිවැය මත ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය ගණනය කර ඇත.

දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව පහත පරිදි ක්ෂය කෙරේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල උපකරණ | 20% |

මෝටර් රථ, භාණ්ඩ බෙදාහැරීම සඳහා යොදා ගනු ලබන අතර අනෙකුත් වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

[තුන්වැනි පිටුව බලන්න.

(vi) ගනුදෙනුකරුවෙකු විසින් සමාගමට විරුද්ධව පවරා තිබූ නඩුවක තීන්දුව 2020.05.15 දින ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ අනුව එදිනට සම්පූර්ණ වන්දිය පියවීම සඳහා රු. 550 000 ක් ගෙවන ලදී. මෙම නඩුව 2019.12.01 දින ගොනුකර ඇති අතර, සමාගමේ නීතිඥයන්ගේ මතය අනුව මේ සඳහා 2020.03.31 දිනට හඳුනාගත් ප්‍රතිපාදනය ශේෂ පිරික්සුම තුළ දක්වා ඇත. 2020.06.15 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

(vii) ගොඩනැගිල්ලක භාවිත අයිතිය වසර 4 ක කාලයකට ලබා ගැනීම සඳහා 2020.03.01 දින සමාගම විසින් කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. කෙසේ වුව ද අලුත්වැඩියාව සඳහා රු. 500 000 ක් වියදම් දැරීමෙන් පසු 2020.03.31 දින සිට මෙම ගොඩනැගිල්ල භාවිතය සඳහා යොදාගත හැකි විය. මෙම අලුත්වැඩියා කිරීම තුළින් මුළු කල්බදු කාලය තුළම සමාගමට ප්‍රතිලාභ ලැබෙයැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද මෙම මුදල වෙනත් පරිපාලන වියදම් තුළ ගිණුම්ගත කර ඇත. අලුත්වැඩියා කාලය තුළ කල්බදු පොලියක් අය කරනු නොලැබේ. ගිවිසුමට අනුව 2021.03.31 දින සිට රු. 4 413 000 ක වාර්ෂික කල්බදු වාරිකයක් ගෙවිය යුතු වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ කල්බදු පොලිය රු. 1 890 000 කි.

(viii) වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු තුළ පසුගිය වර්ෂය සඳහා ගෙවූ රු. 520 000 ක් ඇතුළත් වේ. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 650 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත විනුග පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

2. (අ) සීමිත සුරංග පොදු සමාගම විසින් අලෙවි කරනු ලබන 'DMI' නම් තොග අයිතමයේ 2020 ජනවාරි මාසයට අදාළ තොරතුරු පහත දී ඇත.

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකක පිරිවැය (රු.) |
|---|---|---|---|
| ජනවාරි 01 | ආරම්භක ශේෂය | 500 | 20 |
| ජනවාරි 05 | ගැනුම් | 300 | 24 |
| ජනවාරි 12 | විකුණුම් | 400 | ? |
| ජනවාරි 15 | ගැනුම් | 300 | 25 |
| ජනවාරි 25 | විකුණුම් | 300 | ? |
| ජනවාරි 31 | ගැනුම් | 200 | 26 |

**අවශ්‍යවන්නේ:**

(1) පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයට අනුව 2020.01.31 දිනට 'DMI' තොගයේ පිරිවැය

(2) පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයට අනුව 2020 ජනවාරි මාසය සඳහා විකුණුම් පිරිවැය

(3) භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුව 2020 ජනවාරි මාසය සඳහා විකුණුම් පිරිවැය

**(ලකුණු 12 යි)**

(ආ) දිනේෂ් සමාගම 'A' සහ 'B' ලෙස භාණ්ඩ වර්ග දෙකක් නිෂ්පාදනය කරයි. මෙම සමාගම සතු කර්මාන්ත ශාලාව එකලස් සහ නිමැවුම් නමින් නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් ද, ගබඩාව නම් සේවා දෙපාර්තමේන්තුවකින් ද සමන්විත වේ. මෙම සියලු දෙපාර්තමේන්තු එකම පරිශ්‍රයේ පිහිටා ඇත. තවද සමාගම සතුව පරිපාලන දෙපාර්තමේන්තුවක් ඇති අතර, එය වෙනම ගොඩනැගිල්ලක පිහිටුවා ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ඒකක 5 000 ක ක්‍රියාකාරී මට්ටමේ දී අයවැයගත පොදු කාර්ය පිරිවැය පහත දී ඇත.

| විස්තරය | එකතුව (රු.'000) | කර්මාන්ත ශාලාව (රු.'000) | පරිපාලන දෙපාර්තමේන්තුව (රු.'000) |
|---|---|---|---|
| වක්‍ර වේතන | 750 | 700 | 50 |
| නිෂ්පාදන කළමනාකරුවන්ගේ වැටුප් | 900 | 900 | – |
| ගොඩනැගිලි කුලී | ? | 960 | ? |
| යන්ත්‍ර ක්ෂය | 800 | 800 | – |
| කාර්යාල උපකරණ ක්ෂය | 30 | – | 30 |
| විදුලි ගාස්තු | 400 | ? | ? |
| වෙනත් නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 290 | 290 | – |

[හතරවැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

(i) පොදු කාර්ය පිරිවැය විභජන පදනම් පහත පරිදි වේ:

| **විස්තරය** | **එකලස්** | **නිමැවුම්** | **ගබඩාව** |
|---|---|---|---|
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 24 000 | 16 000 | 8 000 |
| කිලෝවොට් පැය | 2 000 | 1 000 | 500 |
| සේවක සංඛ්‍යාව | 20 | 12 | 3 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 3 000 000 | 2 000 000 | – |

(ii) කර්මාන්තශාලාවෙහි නිෂ්පාදන කළමනාකරුවන් තිදෙනෙකු සේවයේ යොදවා ඇති අතර එයින් දෙදෙනෙකු එකලස් දෙපාර්තමේන්තුවේ ද, අනෙක් කළමනාකරු නිමැවුම් දෙපාර්තමේන්තුවේ ද සේවය කරයි. ඔවුන් එක් අයෙකුට රු. 25 000 ක් බැගින් මාසික වැටුපක් ගෙවනු ලැබේ.

(iii) පරිපාලන දෙපාර්තමේන්තුව පිහිටා ඇති ගොඩනැගිල්ල සඳහා සමාගම විසින් රු. 10 000 ක මාසික කුලියක් ගෙවනු ලබන අතර එහි වාර්ෂික විදුලි පරිභෝජනය කිලෝවොට් පැය 500 කි.

(iv) එකලස්, නිමැවුම් සහ ගබඩාව සඳහා වෙනත් නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය පිළිවෙළින් රු. 190 000 ක්, රු. 70 000 ක් සහ රු 30 000 ක් වේ.

(v) ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක අතර සමානව නැවත විභජනය කෙරේ.

(vi) නිෂ්පාදන දෙපාර්තමේන්තුවල පොදු කාර්ය පිරිවැය යන්ත්‍ර පැය මත පදනම්ව අන්තර්ග්‍රහණය කෙරේ. එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල වාර්ෂික ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන පිළිවෙළින් 50 000 ක් හා 60 000 ක් වේ.

(vii) පහත තොරතුරු සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන **'A'** සහ **'B'** භාණ්ඩ දෙක සඳහා අදාළ වේ.

| | **A** | **B** |
|---|---|---|
| ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සත්‍ය යන්ත්‍ර පැය: | | |
| එකලස් දෙපාර්තමේන්තුව (පැය) .................. | 02 | 04 |
| නිමැවුම් දෙපාර්තමේන්තුව (පැය) ............... | 03 | 02 |
| ඒකකයක් සඳහා ප්‍රාථමික පිරිවැය (රු.) ..................... | 225 | 310 |
| විකුණුම් මිල මත ලාභ ආන්තිකය.......................... | 25% | 20% |

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) මුළු පරිපාලන පොදු කාර්ය පිරිවැය

(4) **'A'** භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය

(5) **'B'** භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල

**(ලකුණු 28 යි)**

**(මුළු ලකුණු 40 යි)**

**3.** නාමල් ඔටෝ කෙයා තනි පුද්ගල ව්‍යාපාරයකි. මෙම ව්‍යාපාරය, පුද්ගලික සහ ආයතනික ගනුදෙනුකරුවන්ට වාහන නඩත්තු සේවා සපයනු ලබයි. 2020.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ආරම්භක ශේෂ පහත පරිදි විය.

| **වත්කම්** | **රු.'000** | **වගකීම් හා හිමිකම** | **රු.'000** |
|---|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 900 | දිගුකාලීන ණය | 400 |
| තොගය (නඩත්තු අමුද්‍රව්‍ය) | 160 | වෙළෙඳ ගෙවිය යුතු දෑ | 90 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 130 | ගෙවිය යුතු විදුලිය | 12 |
| ඉදිරියට ගෙවූ කුලිය | 240 | ආයතනික ගනුදෙනුකරුවෙකුගෙන් ලද අත්තිකාරම | 10 |
| සේවකයන්ට ගෙවූ වැටුප් අත්තිකාරම් | 34 | හිමිකම | 1 052 |
| බැංකුවේ ඇති මුදල් | 100 | | |

මෙම ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලැබේ.

[පස්වැනි පිටුව බලන්න.

2020 ජනවාරි මාසය තුළ දී පහත ගනුදෙනු ව්‍යාපාරය තුළ සිදු කරන ලදී.

(i) වාහන සේදුම් යන්ත්‍රයක් රු. 360 000 කට ණයට මිල දී ගන්නා ලදී. 2022.01.01 දිනෙන් ආරම්භ වී වර්ෂ 03 ක කාලයක් තුළ මෙම ණය මුදල ගෙවිය යුතු වේ.

(ii) පිරිවැය රු. 130 000 ක් වූ නඩත්තු ද්‍රව්‍ය මිල දී ගන්නා ලද අතර, ඒ සඳහා රු. 60 000 ක මුදලක් ගෙවන ලදී. ඉතිරි මුදල මාස දෙකක් තුළ ගෙවිය යුතු වේ.

(iii) පුද්ගලික ගනුදෙනුකරුවන්ට රු. 140 000 ක නඩත්තු සේවා මුදලට සපයන ලදී. මේ සඳහා භාවිත කරන ලද නඩත්තු ද්‍රව්‍යවල පිරිවැය රු. 86 000 ක් විය.

(iv) රු. 12 000 ක් වූ අයිතිකරුගේ ජීවිත රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

(v) රු. 5 000 ක වට්ටමක් ලබා දීමෙන් පසු රු. 45 000 ක චෙක්පතක් ණයගැතියෙකුගෙන් ලැබුණි.

(vi) ආයතනික ගනුදෙනුකරුවෙකුට රු. 50 000 ක නඩත්තු සේවා සපයන ලදී. 2020.01.01 දිනට ආයතනික ගනුදෙනුකරුවෙකුගෙන් ලද අත්තිකාරම මෙම ගනුදෙනුවට අදාළ වන අතර, ඉතිරි මුදල වූ රු. 40 000 ක් සේවාව ලබාදීමෙන් පසුව ලැබුණි. පිරිවැය රු. 30 000 ක් වූ නඩත්තු ද්‍රව්‍ය මෙම සේවාව සඳහා භාවිත කරන ලදී.

(vii) වැඩිහිටි නිවාසයක වාහනයක් සඳහා නඩත්තු සේවාවක් නොමිලේ සපයන ලදී. පිරිවැය රු. 6 000 ක් වූ නඩත්තු අමුද්‍රව්‍ය මේ සඳහා භාවිත කරන ලදී.

(viii) ව්‍යාපාරයේ මාසික ගිනි රක්ෂණ වාරිකය වූ රු. 4 000 ක් අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලදී.

(ix) දිගුකාලීන ණය රු. 400 000 සඳහා රු. 67 000 ක ණය වාරිකයක් ගෙවන ලදී. එය තුළ රු. 17 000 ක පොලියක් ඇතුළත් විය.

(x) ආයතනික ගනුදෙනුකරුවන්ට රු. 300 000 ක නඩත්තු සේවා ණයට සපයන ලදී. මෙම වටිනාකම මත 2% ක වෙළෙඳ වට්ටමක් ලබාදෙන ලදී. මෙම සේවා සැපයීම් සඳහා රු. 154 000 ක් පිරිවැය වූ නඩත්තු ද්‍රව්‍ය භාවිත කරන ලදී.

(xi) සේවකයන්ගේ මාසික වැටුප රු. 84 000 ක් වූ අතර, 2020.01.01 දිනට පැවති වැටුප් අත්තිකාරම් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල ගෙවන ලදී.

(xii) 2020.01.01 දිනට ගෙවිය යුතු විදුලි බිල්පත ගෙවන ලදී. රු. 11 000 ක විදුලි බිල්පතක් ජනවාරි මාසය සඳහා ලද අතර එය මෙතෙක් ගෙවා නොමැත.

(xiii) පිරිවැය රු. 8 000 ක නඩත්තු ද්‍රව්‍ය හානි වූ අතර ඒවා රු. 3 000 ක අත්පිට මුදලට විකුණන ලදී.

(xiv) පසුගිය මාසය තුළදී කපා හරින ලද වෙළෙඳ ණයගැති ශේෂයක් සඳහා රු. 14 000 ක් ලැබුණි.

(xv) ව්‍යාපාර ස්ථානයේ මාසික කුලිය රු. 20 000 ක් වේ. 2020.01.01 දින කලින් ගෙවූ කුලිය තුළ දක්වා ඇත්තේ 2020 ලිත් වර්ෂය සඳහා ගෙවන ලද කුලී මුදලයි.

**අවශ්‍යවන්නේ:**

(1) 2020.01.01 දිනට ශේෂ සටහන් කර අංක (i) සිට (xv) දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් වටිනාකම ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

**(රු.'000)**

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| **ආරම්භක ශේෂය** | | | | | | | | | | |
| **ගනුදෙනු:** | | | | | | | | | | |
| **(i)** | | | | | | | | | | |
| **(ii)** | | | | | | | | | | |
| **......** | | | | | | | | | | |
| **......** | | | | | | | | | | |
| **අවසාන ශේෂය** | | | | | | | | | | |

(2) 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

4. (අ) පහත තොරතුරු ක්‍රීඩා සමාජයක ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | 2020.03.31 දිනට (රු.) | 2019.03.31 දිනට (රු.) |
|---|---|---|
| සමුච්චිත අරමුදල | ? | 300 000 |
| යාවජීව සාමාජික අරමුදල | 160 000 | 200 000 |
| ක්‍රීඩා උපකරණ අරමුදල | ? | 400 000 |
| ගොඩනැගිලි අරමුදල | 1 000 000 | – |

අතිරේක තොරතුරු:

(i) සාමාජිකයකු සඳහා වාර්ෂික සාමාජික මුදල රු. 6 000 ක් වේ. 2019.03.31 දිනට ක්‍රීඩා සමාජයෙහි සාමාජිකයන් 60 ක් සිටි අතර, ඔවුන්ගෙන් 10 ක් යාවජීව සාමාජිකයන් වේ. යාවජීව සාමාජිකත්වය ක්‍රීඩා සමාජයෙහි ප්‍රවර්ධකයන්ට පමණක් සීමා වේ.

(ii) වාර්ෂික සාමාජික මුදල වර්ෂය මුලදී සම්පූර්ණයෙන්ම හෝ මාසිකව සමාන වාරික මගින් ගෙවිය හැක. වාර්ෂික සාමාජික මුදල සම්පූර්ණයෙන් එකවර ගෙවන්නේ නම් සාමාජිකයන්ට 10% ක වට්ටමක් දෙනු ලැබේ. මෙම වට්ටම් ක්‍රීඩා සමාජයෙහි වියදමක් ලෙස සලකනු ලැබේ.

(iii) 2019.04.01 දින ක්‍රීඩා සමාජයට අලුතින් බැඳුණු සාමාජිකයන් 05 දෙනෙකු ද ඇතුළුව සාමාජිකයන් 40 දෙනෙකු විසින් 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල එකවර වර්ෂය මුලදී ගෙවන ලදී. අනෙකුත් අය මාසික පදනම යටතේ සාමාජික මුදල් ගෙවන ලදී.

(iv) පරිත්‍යාග ලැබීම් ආදායම තුළ හඳුනාගනු ලබන්නේ ඒවා භාවිත කළ ප්‍රමාණය පදනම්ව ය.

(v) 2020.03.31 දින ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා ක්‍රීඩා සමාජය විසින් රු. 200 000 ක මුදලක් වියදම් කළ අතර, එයින් රු. 150 000 ක් ක්‍රීඩා උපකරණ අරමුදලින් ලබා ගන්නා ලදී.

(vi) ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා රු. 86 000 ක වියදමක් දරමින් 2019.12.01 දින ව්‍යාපෘති වාර්තාවක් සකස් කරගන්නා ලදී. මේ සඳහා රු. 1 000 000 ක පරිත්‍යාග 2020.01.01 දින ලද අතර එය ගොඩනැගිලි අරමුදල තුළ සටහන් කර ඇත. කෙසේ වුව ද, රට තුළ ඇති වූ කොවිඩ්-19 වසංගතය නිසා මෙම ක්‍රීඩාංගණය ඉදිකිරීම අපේක්ෂිත පරිදි ආරම්භ කිරීමට ක්‍රීඩා සමාජය අපොහොසත් විය.

(vii) ක්‍රීඩා සමාජයේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් මෙහෙයුම් වියදම් රු. 250 000 ක් විය.

අවශ්‍යවන්නේ:

(1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(2) 2020.03.31 දිනට හිමිකම (එක් එක් අයිතමය වෙන වෙනම දක්වන්න.) **(ලකුණු 14 යි)**

(ආ) සීමිත සුමුදු පොදු සමාගම වෙළෙඳ ව්‍යාපාරයක් වන අතර එය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. සමාගම භාණ්ඩ මිල දී ගැනීම ණය පදනම මත පමණක් සිදුකරන අතර, භාණ්ඩ විකිණීම මුදලට සහ ණයට යන දෙයාකාරයටම සිදු කරනු ලබයි. 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත තොරතුරු ව්‍යාපාරයේ ණයගැති සහ ණයහිමි ලෙජරයන්ගෙන් උපුටා ගන්නා ලදී.

*2020.03.31 දිනට ණයගැති ලෙජරය* (රු.'000) :

| විස්තරය | නාමල් ට්‍රේඩර්ස් | ගමගේ ට්‍රේඩර්ස් | නදුන් ට්‍රේඩර්ස් | එකතුව |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 100 | 50 | 150 | 300 |
| විකුණුම් (8% ක VAT සහිතව) | – | 324 | 486 | 810 |
| මුදල් ලැබීම් | (75) | (50) | (500) | (625) |
| දුන් වට්ටම් | (5) | – | (10) | (15) |
| **අවසන් ශේෂය** | **20** | **324** | **126** | **470** |

*2020.03.31 දිනට ණයහිමි ලෙජරය* (රු.'000) :

| විස්තරය | සමන් ට්‍රේඩර්ස් | අමල් ට්‍රේඩර්ස් | මහේෂ් ට්‍රේඩර්ස් | එකතුව |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 300 | – | 150 | 450 |
| ගැනුම් (8% ක VAT සහිතව) | 540 | 432 | 216 | 1 188 |
| මුදල් ගෙවීම් | (290) | (200) | (150) | (640) |
| ලද වට්ටම් | (10) | – | – | (10) |
| **අවසන් ශේෂය** | **540** | **232** | **216** | **988** |

[හත්වැනි පිටුව බලන්න.

2020.03.01 දිනට ණයගැති සහ ණයහිමි ලෙජර ශේෂ ලැයිස්තුවල එකතුව අදාළ පාලන ගිණුම්වල එදිනට වූ ශේෂ සමඟ සමාන විය.

2020.03.01 දින මුදල් ගිණුමේ ශේෂය රු. 50 000 ක් විය. ණයගැති හා ණයහිමි ලෙජර තුළ ඇතුළත් මුදල් ගනුදෙනුවලට අමතරව පහත මුදල් ගනුදෙනු ද 2020 මාර්තු මාසය තුළ දී සිදු විය.

- සමාගමේ මුදලට විකුණුම් රු. 972 000 ක් විය. (8% ක VAT සහිතව)
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවක දායකත්වය ලෙස රු. 48 000 ක් අඩුකර ගැනීමෙන් පසුව රු. 552 000 ක වැටුප් ගෙවන ලදී.
- 2020 පෙබරවාරි මාසය සඳහා EPF රු. 120 000 ක් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා රු. 18 000 ක් ප්‍රේෂණය කරන ලදී.
- රු. 250 000 ක් වෙනත් වියදම් සඳහා ගෙවන ලදී.

EPF සඳහා සේවක සහ සේව්‍ය දායකත්වය පිළිවෙළින් 8% ක් සහ 12% ක් වේ. තවද ETF සඳහා සේව්‍ය දායකත්වය 3% කි. EPF සහ ETF යන දෙකෙහිම දායකත්වයන් සේවකයින්ගේ දළ වැටුප මත ගණනය කරනු ලබයි. සමාගම කිසියම් මාසයක EPF සහ ETF ඊළඟ මාසයෙහි 5 වන දිනයේදී ප්‍රේෂණය කරනු ලබයි.

2020.03.01 දිනට VAT පාලන ගිණුමේ බැර ශේෂය රු. 40 000 කි.

*(වෙනත් වියදම් සඳහා VAT නොමැති බව උපකල්පනය කරන්න. ගනුදෙනුවල දිනයන් නොසලකා හරින්න.)*

**අවශ්‍යවන්නේ:**

(1) 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත්:

(i) ගැනුම් ජර්නලය

(ii) මුදල් ලැබීම් ජර්නලය

(iii) මුදල් ගෙවීම් ජර්නලය

(2) 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්:

(i) මුදල් ගිණුම

(ii) ණයගැති පාලන ගිණුම

(iii) එකතු කළ අගය මත බදු (VAT) පාලන ගිණුම

(iv) වැටුප් පාලන ගිණුම

(v) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම

**(ලකුණු 26 යි)**

**(මුළු ලකුණු 40 යි)**

5. (අ) නෙතු සහ මුතු පහත කොන්දේසි යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

- නෙතු සහ මුතු පිළිවෙළින් 2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනී.
- සෑම හවුල්කරුවකුම මාසිකව රු. 50 000 ක වේතනයකට හිමිකම් කියයි.
- සෑම හවුල්කරුවකුම වර්ෂයේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් කියයි.
- ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලබයි.
- කීර්තිනාම ගැළපීම් හැර හවුල්කරුවන් සමග සිදු කරන අනෙකුත් සියලුම ගනුදෙනු ඔවුන්ගේ ජංගම ගිණුම් මගින් සටහන් කරනු ලබයි.

2020.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙහි ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම්: | | |
| නෙතු | | 2 000 |
| මුතු | | 1 000 |
| ජංගම ගිණුම්: | | |
| නෙතු | | 400 |
| මුතු | | 200 |
| 2019.04.01 දිනට 5% ණය ගිණුම - රිතු | | 800 |
| දේපළ, පිරියත සහ උපකරණ (2020.03.31 දිනට ධාරණ වටිනාකම) | 4 100 | |
| විකුණුම් | | 6 000 |
| විකුණුම් පිරිවැය | 1 850 | |
| මෙහෙයුම් වියදම් | 2 600 | |
| 2020.03.31 දිනට තොගය | 700 | |
| ණය ආපසු ගෙවීම - රිතු | 420 | |
| ගැනිලි (මුදල්) - නෙතු | 500 | |
| අතැති මුදල් | 3 230 | |
| ගංගා ගෙන ආ මුදල | | 3 000 |
| | 13 400 | 13 400 |

**අතිරේක තොරතුරු:**

(i) 2020.03.31 දිනට තොගය භෞතික ආගණනය මත පදනම්ව මිනුම් කර ඇත.

(ii) වර්ෂය තුළ නෙතු සහ මුතු සිදු කළ භාණ්ඩ ගැනිලි පිළිවෙළින් රු. 60 000 ක් සහ රු. 40 000 ක් විය. මේවා මෙතෙක් පොත්වල ගිණුම්ගත කර නොමැත.

(iii) ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති රිතුගේ ණය ආපසු ගෙවීම් ගිණුමේ ශේෂය, 2019.09.30 දින තෙක් ගෙවූ ණය පොලිය සහ එදිනට ණය මුදලෙන් 50% ක් පියවීම සඳහා ගෙවූ මුදලින් සමන්විත වේ. ඉතිරි ණය ශේෂය සඳහා ගෙවිය යුතු පොලිය ගිණුම්ගත කර නොමැත.

(iv) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි වෙළෙඳ බලපත්‍රය අලුත් කිරීම සඳහා රු. 10 000 ක් නෙතු විසින් සිය පෞද්ගලික මුදලින් ගෙවා ඇත. මෙය ගිණුම්ගත කර නොමැත.

(v) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ රක්ෂණ වාරිකය රු. 140 000 ක් හවුල් ව්‍යාපාරය විසින් ගෙවා ඇති අතර එය ව්‍යාපාරයෙහි මෙහෙයුම් වියදම් තුළ සටහන් කර ඇත. කෙසේ වුව ද මෙම ගෙවීම තුළ මුතුගේ පෞද්ගලික මෝටර් රථයෙහි රක්ෂණ වාරිකය වෙනුවෙන් ගෙවූ රු. 40 000 ක් ඇතුළත් බව පසුව අනාවරණය විය.

(vi) 2020.03.31 දින ගංගා නව හවුල්කරුවකු ලෙස බඳවාගන්නා ලදී. ගංගා එදින ඇයගේ ප්‍රාග්ධනයට හා කීර්තිනාමයට දායකත්වය ලෙස රු. 3 000 000 ක් ව්‍යාපාරයට ගෙන එන ලදී. නෙතු, මුතු සහ ගංගා අතර නව ලාභාලාභ අනුපාතය පිළිවෙළින් 5:3:2 ලෙස එකඟ විය. මෙදිනට ව්‍යාපාරයෙහි කීර්තිනාමය රු. 1 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍යවන්නේ:**

(1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ආදායම් ප්‍රකාශනය
(හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුළත්ව)

(2) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

**(ලකුණු 20 යි)**

PAST PAPERS WIKI

Past Papers Wiki



(ආ) සීමිත අශාන් පොදු සමාගමේ 2020.03.31 දිනට සහ 2019.03.31 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දැක්වේ.

| විස්තරය | 2020.03.31 දිනට (රු.'000) | 2019.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - (ධාරණ වටිනාකම) | 35 500 | 30 100 |
| තොගය | 9 750 | 7 250 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 8 500 | 10 750 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 500 | 1 500 |
| මුළු වත්කම් | 56 250 | 49 600 |
| | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 28 000 | 20 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 3 000 | 2 000 |
| රඳවාගත් ඉපැයුම් | 6 500 | 2 200 |
| කල්බදු ණයහිමියෝ | 12 500 | 16 500 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 4 350 | 7 400 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | 500 | 600 |
| බැංකු අයිරාව | 1 400 | 900 |
| **මුළු හිමිකම හා වගකීම්** | 56 250 | 49 600 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරේක තොරතුරු:

(i) වර්ෂය තුළ සමාගම අතුරු ලාභාංශ ලෙස රු. 1 200 000 ක් ගෙවූ අතර රු. 2 000 000 ක රඳවාගත් ඉපැයීම් ප්‍රාග්ධනිත කරන ලදී. තවද, සමාගම සාමාන්‍ය කොටස් 100 000 ක් මහජනයාට නිකුත් කළ අතර සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව ලැබී ඇත.

(ii) වර්ෂය සඳහා ක්ෂය සහ ආදායම් බදු වියදම පිළිවෙළින් රු. 2 100 000 ක් සහ රු. 1 160 000 ක් විය.

(iii) වර්ෂය තුළදී සමාගම සිය ඉඩම් ප්‍රථම වරට අතිරික්තයක් සහිතව ප්‍රත්‍යාගණනය කරන ලදී. වර්ෂය තුළ වෙනත් ප්‍රත්‍යාගණනයක් සිදුකර නොමැත.

(iv) 2019.10.01 දින සමාගම රු. 400 000 ක ලාභයක් සහිතව යන්ත්‍රයක් විකුණන ලදී. මෙම යන්ත්‍රය 2017.04.01 දින රු. 3 000 000 කට මිල දී ගෙන තිබූ අතර එය සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කර ඇත. තවද වර්ෂය තුළදී නව මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගෙන ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අශාන් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

6. (අ) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ කර්මාන්තයේ නියුතු සමාගම් තුනකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| අනුපාතය | සීමිත ඇල්ෆා පොදු සමාගම | සීමිත බීටා පොදු සමාගම | සීමිත ගැමා පොදු සමාගම |
|---|---|---|---|
| ජංගම | 1.2 : 1 | 2.8 : 1 | 2.5 : 1 |
| ක්ෂණික වත්කම් | 0.96 : 1 | 2.5 : 1 | 2 : 1 |
| තොග පිරිවැටුම (වාර) | 9.5 | 8.3 | 6.2 |
| ණයගැති පිරිවැටුම (වාර) | 4.1 | 4.5 | 3.8 |
| ණය හිමිකම් | 65% | 80% | 60% |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | 9% | 12% | 14% |

**අවශ්‍යවන්නේ:**

පහත එක් එක් තත්ත්වයන්ට අදාළ සමාගම හඳුනාගෙන එයට පදනම් වූ අනුපාතය සඳහන් කරන්න.

(1) ඉහළම තෝලනය සහිත සමාගම

(2) තොග භාවිතයේ වැඩිම කාර්යක්ෂමතාවය දක්වනු ලබන සමාගම

(3) ඉහළම ද්‍රවශීලතාවය සහිත සමාගම

(4) ආයෝජන මත වැඩිම ප්‍රතිලාභය ජනනය කරනු ලබන සමාගම

(5) ගනුදෙනුකරුවන්ගෙන් මුදල් එකතු කිරීමේදී වැඩිම කාර්යක්ෂමතාවය දක්වනු ලබන සමාගම **(ලකුණු 10 යි)**

[දහවැනි පිටුව බලන්න.

(ආ) සීමිත මලිත් රසායනාගාර පොදු සමාගම විසින් පැරණි වෛද්‍ය පරීක්ෂණ උපකරණය වෙනුවට නවීන පරීක්ෂණ උපකරණයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මෙම නව උපකරණය අත්පත් කරගතහොත් පැරණි උපකරණය එහි පොත් අගය වූ රු. 250 000 කට විකිණිය හැක.

මෙම නව උපකරණයේ ඇස්තමේන්තුගත මුදල් ගලාඒම් සහ ගලායෑම් පහත පරිදි වේ.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| උපකරණයේ ගැනුම් මිල | 1 800 |
| උපකරණය ප්‍රවාහනය කිරීමේ පිරිවැය | 200 |
| උපකරණය ස්ථාපනය කිරීමේ පිරිවැය | 75 |
| ඵලදායී ජීව කාලය අවසානයේ උපකරණයෙහි සුන්බුන් අගය | 125 |
| ව්‍යාපෘතිය ආරම්භයේ අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය | 275 |

අතිරේක කාරක ප්‍රාග්ධනය ව්‍යාපෘතිය අවසාන වසරේදී අයකර ගත හැකි ය. නව උපකරණයේ අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 5 කි. මෙම නව උපකරණය මිල දී ගතහොත් සමාගමේ බදු පසු ලාභයේ වාර්ෂික වැඩි වීම රු. 210 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර, එහි වට්ටම් සාධක ආසන්න දශම ස්ථාන දෙකකට පහත පරිදි ය.

| **වසර** | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| **වට්ටම් සාධකය** | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියෙහි එක් එක් වර්ෂය සඳහා මුදල් ගලාඒම් සහ මුදල් ගලායාම් ලේඛනය

(2) ව්‍යාපෘතියෙහි ශුද්ධ වර්තමාන අගය (NPV)

(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව නව උපකරණය මිල දී ගැනීම සඳහා නිර්දේශය

**(ලකුණු 10 යි)**

(ඉ) කොවිඩ්-19 වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා උපදෙස් ඇතුළත් අත්පොතක් මුද්‍රණය කිරීමට සුබසාධක සමිතියක් තීරණය කර ඇත. නිරෝධායන මධ්‍යස්ථානවල සිටින පුද්ගලයන්ට මෙම අත්පොත, අත්වැසුම් යුගලයක් සහ මුහුණු ආවරණයක් සමග නොමිලේ බෙදාහැරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනට සහභාගී වන සෑම ප්‍රතිලාභියකු සඳහාම රු. 1 500 බැගින් අනුග්‍රාහකත්වය දැරීමට සබන් නිෂ්පාදන සමාගමක් එකඟත්වය පළකර ඇත.

මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත පිරිවැය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| අත්පොත පිළියෙල කිරීම සඳහා වෛද්‍යවරුන්ගේ උපදේශන ගාස්තු | 30 000 |
| අත්පොතක මුද්‍රණ පිරිවැය | 700 |
| අත්පොත සංස්කරණය කිරීමේ පිරිවැය | 25 000 |
| පරිච්ඡේදයක් ලිවීම සඳහා පිරිවැය (අත්පොතෙහි පරිච්ඡේද 07 ක් ඇත) | 10 000 |
| මෙම අත්පොතෙහි චිත්‍ර ඇඳීම සඳහා පිරිවැය | 10 000 |
| පිටුවක් සඳහා යතුරුලියන පිරිවැය (අත්පොතෙහි මුළු පිටු ගණන 50 ක් වේ) | 300 |
| අත්වැසුම් යුගලයක පිරිවැය | 100 |
| මුහුණු ආවරණයක පිරිවැය | 200 |

**අවශ්‍යවන්නේ:**

(1) මුළු ස්ථාවර පිරිවැය සහ ප්‍රතිලාභියකු සඳහා විචල්‍ය පිරිවැය

(2) මෙම වැඩසටහනේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා:

(i) අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව

(ii) සබන් නිෂ්පාදන සමාගමෙන් අපේක්ෂිත අනුග්‍රාහකත්වය


(3) මෙම වැඩසටහන තුළින් සුබසාධක සමිතියේ අරමුදලට රු. 100 000 ක අතිරික්තයක් ලබාගැනීම සඳහා අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව


(4) මෙම වැඩසටහන සඳහා සබන් නිෂ්පාදන සමාගම විසින් රු. 900 000 ක අනුග්‍රාහකත්වයක් ලබා දේ නම්, සුබසාධක සමිතියේ අරමුදලට ලබාගත හැකි අතිරික්තය

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *


වාරෙටම ඕන කරන පොත්
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්
Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ම අභ්‍යාස පොතකට 25%ක විශේෂ ව
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER A/L
TERM TEST PAPERS,
SHORT NOTES,
WORKBOOKS & REVISION
BOOKS
SINHALA, ENGLISH & TAMIL MEDIUM
a+b²
LOL BOOK STORE
CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE
0717774440 (WHATSAPP)
WWW.LOL.LK